# ග්‍රාමීය වැඩිහිටි කමිටු සඳහා භෞතික උපකරණ ලබා දීමේ වැඩසටහන

## හැඳින්වීම

වර්තමාන සමාජයේ බොහෝ වැඩිහිටියන් හුදකලාභාවයට පත්ව ජීවත්වන අතර මෙම තත්ත්වය අවම කිරීමේ අරමුණින් යුතුව ක්‍රියාත්මක වන  ග්‍රාමීය වැඩිහිටි කමිටු හරහා වැඩිහිටි ප්‍රජාව සක්‍රීය දිවි පෙවෙතක් වෙත යොමු වෙමින් ඇත. දැනට දිවයින පුරා ග්‍රාමීය වැඩිහිටි කමිටු 11935 ක් පිහිටුවා ඇති අතර.භෞතික උපකරණ සැපයීම මඟින් සමිතියේ සාමාජිකයින්ට වැඩකටයුතු පහසුවෙන් කරගෙන යාමට ඉඩ සැලසේ..

## අරමුණ

ග්‍රාමීය වැඩිහිටි කමිටු ශක්තිමත් කර වැඩිහිටි ජනගහනයේ සහභාගීත්වය වැඩි කිරීම.

මේ තුලින් රටේ වැඩිහිටි පරපුර රටට බරක් නොමැති පිරිසක් ලෙස ජීවත් වීමේ හැකියාව තුලින් ස්වාධීන වැඩිහිටි පරපුරක් බිහි කිරීම.

## 1.ග්‍රාමීය වැඩිහිටි කමිටු සඳහා භෞතික උපකරණ ලබා දීමේ වැඩසටහන සඳහා සැලකිය යුතු කරුණු

1. ලියාපදිංචි ග්‍රාමීය වැඩිහිටි සමිතියක් විය යුතුය.
2. ග්‍රාමීය වැඩිහිටි සමිතිය පසුගිය වසර 05 තුල ක්‍රියාකාරී වැඩිහිටි සංවිධානයක් විය යුතුය.
3. භෞතික උපකරණ ලබා ගැනිම සම්බන්ධව අදාල ග්‍රාමීය වැඩිහිටි කමිටුවේ මහා සභා රැස්වීමක යෝජනා ස්ථිරත්වයක් තිබිය යුතු අතර අදාල වාර්ථාව ඇමුණුමත් ලෙසින් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
4. ප්‍රාදේශීයලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරි/ සමාජ සේවා නිලධාරි (පළාත්)/ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/ සංවර්ධන නිලධාරි (සමාජ සේවා) / විසින් අදාල ඉල්ලීම පිළිබඳ නිර්දේශ සහිත ක්ෂේත්‍ර වාර්ථාවක් ඉදිරිපත් කල යුතුය.
5. ලබා ගැනීමට අපේක්ෂිත භාණ්ඩ සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශ කරන ලද ඇස්තමේන්තුවත් ඉදිරිපත් කල යුතුයි.
6. දුෂ්කර ග්‍රාම නිලධාරි වසම් සඳහා ප්‍රමුඛතාව ලබා දීමට කටයුතු කළ යුතුය.
7. ග්‍රාමීය වැඩිහිටි සමිති යාවත්කාලින කරන ලද ගිණුමේ ඡායා පිටපතක්.
8. ග්‍රාමීය වැඩිහිටි සමිතියේ සමාජික නාම ලේඛණය.
9. ග්‍රාමීය වැඩිහිටි සමිතිය සතු වත්කම් ලේඛණය.
10. ලබා දෙන ලද භාණ්ඩ සුරක්ෂිතව තබා ගැනිම සඳහා ස්ථානයක් හඳුනාගෙන තිබිම.

## 2. ප්‍රතිලාභීන් තෝරා ගැනීම

ඉහත සඳහන් නිර්ණායක යටතේ ප්‍රාදේශීය ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු වන මාණ්ඩලික නිලධාරියෙකු, මූලස්ථාන ග්‍රාම නිලධාරි,සමාජසේවා නිලධාරි, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි යන අයගෙන් තිදෙනෙකුගෙන් සහිත කමිටුවක් මඟින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට වඩාත් සුදුසු ග්‍රාමීය වැඩිහිටි කමිටු 02 ප්‍රමුඛතාවයේ අනුපිළිවෙලට තෝරා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව 2020.04.30 දිනට පෙර මා වෙත යොමු කළ යුතුය.

## 3 ලබා දෙන උපකරණ

I. වැඩිහිටි සංවිධානයේ කටයුතු හා රැස්වීම් පවත්වාගෙන යාම සඳහා අවශ්‍යය මේස, පුටු වැනි කාර්යාලීය උපකරණ.
II. ප්‍රථමාධාර අවශ්‍යතා සඳහා වන ඇඳක් වැනි උපකරණ.
III. ආහාර පිළියෙල කර ගැනීම ඇතුළු මුළුතැන්ගෙය සඳහා අවශ්‍යය උපකරණ.
IV. වෙනත් අත්‍යවශය උපකරණ.( මෙම උපකරණවල අවශ්‍යතාවය පැහැදිලි කර කමිටුව මඟින් නිර්දේශ කල යුතුය.)

මෙම උපකරණ නිසිපරිදි ආරක්ෂිතව ගබඩාකර තැබීමේ හැකියාවද කමිටුව මඟින් සනාථ කළ යුතු අතර තෝරාගන්නා වැඩිහිටි සමිතියට අදාල වාර්තා (1 මඟින් විස්තර කරන ලද) සමඟ යොමු කළ යුතුය.

එසේම භාණ්ඩ ලද පසු ඉන්වෙන්ට්‍රි ගත කර මා වෙත වාර්තා කිරීම අදාල විෂය නිලධාරින්ගේ වගකීම වේ.

චන්දන රණවීර ආරච්චි
අධ්‍යක්ෂ-සමාජසේවා දෙපාර්තමේන්තුව
වැඩබලන අධ්‍යක්ෂ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**<u>ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබල ගැන්වීම 2021 - වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල</u>**

වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල මගින් මෙම වර්ෂය තුලදී ද ග්‍රාමීය වැඩිහිටි සමිති සවිබල ගැන්වීමේ ක්‍රියාදාමයක් ලෙසින් ග්‍රාමීය වැඩිහිටි සමිති 200 ක් සඳහා උපරිමය රු ලක්ෂයකට යටත්ව අත්‍යවශ්‍ය භෞතික උපකරණ මිලදීගෙන ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිතය.

02.ඒ අනුව මෙම වර්ෂය සඳහා එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින් ක්‍රියාකාරී වැඩිහිටි සමිති 02ක් ඇමුණුම 01නිර්ණායක පරිදි තෝරාගත යුතුව ඇත.

03.2020 වසරේ ඉල්ලීම් ඉදිරිපත් කර එහෙත් තවමත් භෞතික උපකරණ මිලදී ගැනිම සඳහා මුදල් ආධාර ලබා නොදුන් ග්‍රාමීය වැඩිහිටි සමිති සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලබන අතර 2020 වසරේදී යෝජනා කර එවන ලද ග්‍රාමීය වැඩිහිටි සමිති යෝජනා කර එවීම අවශ්‍යය නොවේ.

04.ඒ අනුව ඔබ විසින් මෙම තෝරා ගන්නා ලද ග්‍රාමීය වැඩිහිටි සමිති වෙනුවෙන් අත්‍යවශ්‍ය භෞතික උපකරණ මිලදී ගැනීම සඳහා ලබා දීමට නියමිත උපරිම මුදල රුපියල් 100,000/= සීමාව තුල සකස් කල ඇස්තමේන්තුවක් ඔබගේ නිර්දේශය සහිතව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය අගේ කොට සලකමි.

වන්දන රණවීර ආරච්චි

අධ්‍යක්ෂ-සමාජසේවා දෙපාර්තමේන්තුව

වැඩබලන අධ්‍යක්ෂ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය

පිටපත්

01. දිස්ත්‍රික් ලේකම් - කා.දැ.ස

02.දිස්ත්‍රික් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර/සමාජ සේවා නිළධාරි - කා.දැ.ස. හා අ.ක.ස.